510

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන අංශය

නීතිවේදී උපාධි පාඨමාලාව- 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2022/2023

**LLU6715 -කම්කරු නීතිය**

කාලය - පැය එකයි

දිනය - 02.12.2023 වේලාව - ප.ව 3.30 - ප.ව 4.30

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. සහරා යනු ඉන්දියන් සාගරයේ පිහිටි දූපත් රාජ්‍යයකි. ඇතැම් කාර්මික ආරවුල් සම්බන්ධයෙන් සහරා හි කම්කරු අමාත්‍යවරයා විසින් පහත සඳහන් තීරණ/ක්‍රියාමාර්ග ගනු ලැබීය. ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරින් එම තීරණයන්/ක්‍රියාමාර්ගයන් හි නෛතික වලංගුතාවය විශ්ලේෂණය කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. සහරා හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බව උපකල්පනය කරන්න.

   (අ) එක්තරා කාර්මික ආරවුලක්, සැලකිය යුතු මට්ටමේ ආරවුලක් නොවන නිසා බේරුම්කරණයෙන් නිරාකරණය සඳහා යොමු නොකිරීමට අමාත්‍යවරයා තීරණය කළේය.

   (ආ) යම් කාර්මික ආරවුලක් කම්කරු විනිශ්චය සභාවක් ඉදිරියේ පාර්ශවයන් අතර විභාග වෙමින් පවතින අවස්ථාවේදී අමාත්‍යවරයා විසින් එම ආරවුල බේරුම්කරණයෙන් නිරවුල් කිරීම සඳහා යොමු කරන ලදී.

   (ඇ) බේරුම්කරුවකු වෙත සිදු කර තිබූ යොමු කිරීමක් අවලංගු කර අමාත්‍යවරයා එම ආරවුලම නැවත වරක් වෙනත් බේරුම්කරුවෙකු වෙත යොමු කළේය.

   (ඈ) එක්තරා ආරවුලක් කාර්මික අධිකරණය සඳහා යොමු කිරීමට අමාත්‍යවරයා තීරණය කළේය.

**(ලකුණු 5x4 = 20)**

2 නෛතික අධිකාරීන් ඇසුරින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය තුළ අනියම් සේවා නියුක්තිය සම්බන්ධ නෛතික තත්වය පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

*-හිමිකම ඇවිරිණි-*